JW.ORG

# කෝරා කැරලිගහයි

ගණන් කතාව 16-17

ඔබේ දරුවට ගැළපෙන, දරුවගේ හිත් ගන්නා ක්‍රියාකාරකම් තෝරගෙන පවුලක් විදිහට එකතු වෙලා ඒවා කරන්න.




## ගණන් කතාව 16-17 කියවන්න

ඊටපස්සේ ඒ සිද්ධිය ඇතුළත් බයිබල් චිත්‍ර කතාව කියවන්න. (ඒක ඔන්ලයින් හරි ප්‍රින්ට් කරගෙන හරි කියවන්න) චිත්‍ර කතාව අවසානයේ අහලා තියෙන ප්‍රශ්න සාකච්ඡා කරන්න.

**මෙහෙම කරන්න:** 'යෙහෝවා දෙවිගේ අධිකාරියට ගරු කරන්න' කියන නාට්‍යයට සවන් දෙන්න. (www.jw.org/si වෙබ් අඩවියේ ප්‍රකාශන > නාට්‍යය යටතේ බලන්න.) ඊටපස්සේ පවුලක් විදිහට එකතු වෙලා මේ ප්‍රශ්න සාකච්ඡා කරන්න. (1) කෝරායි එයාගේ පැත්තේ හිටපු අයයි යෙහෝවා දෙවිගේ අධිකාරියට අගෞරව කළේ කොහොමද? (2) යෙහෝවා දෙවිගේ අධිකාරියට ගරු කරනවා කියලා පෙන්වන්න අපිට පුළුවන් කොහොමද?

## තවත් ක්‍රියාකාරකම් ප්‍රින්ට් කරගන්න




### චිත්‍ර පිටුව

**පාට කරන්න** නික්මයාම 28:15-21 කියවන්න. ඊටපස්සේ, ළයවැස්මේ මැණික් ගල් පාට කරන්න පුංචි වයසේ ඉන්න දරුවන්ට උදව් කරන්න. ඒ වගේම ළයවැස්ම කපාගෙන, ඒක ඇඳගන්න උදව් කරන්න.




### පාඩම් පිටුව

**ඔයාට පුළුවන්ද?** රූප කපාගෙන ඊශ්‍රායෙල් කඳවුර හදන්න කියලා පාසැල් යන වයසේ ඉන්න ඔයාගේ පොඩි දරුවට කියන්න. ඊටපස්සේ බයිබල් චරිත කපාගන්න කියන්න. හිස් පින්තූරයේ එයාගේ නම ලියලා එයාව අඳින්න කියලා කියන්න. කඳවුර සම්පූර්ණ කළාට පස්සේ කපාගත්ත රූප යොදාගෙන කෝරාගේ කතන්දරය රඟ දක්වන්න. කතන්දරය රඟ දක්වන අතරතුරේදී දරුවාගෙන් මෙහෙම අහන්න. 'ඔයා එතන හිටියා නම් ඔයා ඉන්නේ කාගේ පැත්තේද?'




### එකතු කරන්න

**බයිබල් චරිත** චරිතෙට අදාළ තොරතුරු කියවන්න. අහලා තියෙන ප්‍රශ්න දරුවගෙන් අහන්න. මේ බයිබල් චරිතෙයි jw.org/si වෙබ් අඩවියේ තියෙන අනිත් බයිබල් චරිතයි අතරින් ලෙවී ගෝත්‍රයට අයිති 5දෙනෙක් හොයන්න ඔබේ දරුවාට උදව් කරන්න. (1) පුංචි කාලෙදීම දෙවිගේ ගෘහයේ සේවය කරපු අනාගතවක්තෘවරයා, (2) අම්රාම්ගේ දරුවන් තුන්දෙනා සහ (3) බයිබල් පොත් 4ක් ලිව්ව පූජකයාගේ පුතා.—**හෝඩුවාවන්:** 1 සාමුවෙල් 3:1; 1 ලේකම් 6:1-3, 33, 34; යෙරෙමියා 1:1 කියවන්න.

**පිළිතුරු:** 1. සාමුවෙල්. 2. ආරොන්, මෝසෙස්, මිරියම්. 3. හිල්කියා.

www.jw.org © 2014 Watch Tower Bible and Tract Society of Pennsylvania